රු.5000.00

203080
2013.01.17

# "පවුලේ යහපැවැත්ම"
# පිළිබඳ දාර්ශනික මනෝ විද්‍යාත්මක විමසුමක්

Libary - USJP
203080

ලියාපදිංචි අංකය GS/HU/2242/2003

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති (දර්ශනය)
පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

203080

# පටුන


පිටුව

අපේක්ෂකයාගේ ප්‍රකාශය i

උපදේශකගේ සහතිකය ii

අධ්‍යනාංශ ප්‍රධාන හිමියන්ගේ සහතිකය iii

පටුන iv

ස්තුතිය v

නිබන්ධ සාරාංශය vi

## පළමු පරිච්ඡේදය

01. හැඳින්වීම 1-6

"පවුලේ යහපැවැත්ම" පිළිබඳ දාර්ශනික මනෝවිද්‍යාත්මක විමසුමක්.

(කොළඹ, රත්නපුර සහ මහනුවර දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර පර්යේෂණයක් ඇසුරෙනි.)

01.1 අධ්‍යයනයේ අරමුණ 6

01.2 පර්යේෂණ ක්‍රම වේදය 6-7

01.3 නියැදිය තෝරා ගැනීම 7

01.4 නියැදිය තෝරාගත් ප්‍රදේශ 8-10

01.5 පර්යේෂණයේදී මතු වූ සීමා 10-11

01.6 පරිච්ඡේද වර්ගීකරණය 11-13

## දෙවන පරිච්ඡේදය


2. පවුල හා විවාහය හඳින්වීම.

2.1 පවුල් ඒකකය හා විවාහ ඒකකයේ ඓතිහාසික වර්ධනය 14-15

2.2 විවාහය පිළිබඳ අර්ථ දැක්වීම. 15-16

2.3 පවුල අර්ථ දැක්වීම. 17-21

2.4 පවුල් වර්ගීකරණය 21-24


## තෙවන පරිච්ඡේදය


3. පවුල් ඒකකය හා විවාහ ඒකකය සම්බන්ධ දාර්ශනික හා මනෝවිද්‍යාත්මක ආකල්ප

3.1 දාර්ශනික ආකල්ප 25-29

3.2 පවුල් ඒකකය හා විවාහ ඒකකය පිළිබඳ මනෝවිද්‍යා ආකල්පය.

3.2.1 ලිංගික ප්‍රේරණය 29-30

3.2.2 ඉගෙනුම 30-31

3.2.3 අනුබද්ධ අවශ්‍යතා ප්‍රේරණය 31

3.2.4 මතෘභාව ප්‍රේණය 32-33


## සිව්වන පරිච්ඡේදය


4. විවාහ ඒකකය හා පවුල් ඒකකය පිළිබඳ ආගමික ආකල්පය

4.1 පවුල් ඒකකය හා විවාහ ඒකකය පිළිබඳ බෞද්ධ ආකල්පය

4.1.1 බෞද්ධ විවාහ ඒකකය 34-40

4.1.2 පවුල් ඒකකය 40-46

4.2 විවාහ හා පවුල් ඒකකය පිළිබඳ හින්දු ආකල්පය

4.2.1 විවාහ ඒකකය 46-51

4.2.2 හින්දු පවුල් ඒකකය 51-56

## පස්වන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 5. | යහපැවැත්ම පිළිබඳ දාර්ශනික මනෝ විද්‍යාත්මක ආකල්පය | |
| 5.1 | යහපැවැත්ම පිළිබඳ දාර්ශනික දෘෂ්ටිය | 57-62 |
| 5.2 | යහපැවැත්ම පිළිබඳ මනෝවිද්‍යාත්මක දෘෂ්ටිය | 62-66 |
| 5.2.1 | සුවදායී පෞරුෂය හා මානසික යහපැවැත්ම | 66-68 |
| 5.2.2 | මානසික සෞඛ්‍ය පිළිබඳ මනෝවිද්‍යාත්මක න්‍යායන් | 69-78 |
| 5.3 | පවුල් ඒකකය හා විවාහ ඒකකය ආශ්‍රිත යහපැවැත්ම බිඳීයාමට බලපාන හේතු | 78-91 |
| 5.4 | යහපැවැත්ම බිඳවැටීමට මානසික ආතතියේ බලපෑම | 91-96 |


## හයවන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 6.1 | නාගරික ජීවන රටාව හා යහ පැවැත්ම | 96-103 |
| 6.2 | ගැමි ජීවන රටාව හා යහපැවැත්ම | 104-112 |
| | සමාලෝචනය | 113-117 |
| | ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 118-121 |

# නිබන්ධ සාරාංශය

**මාතෘකාව -** "පවුලේ යහපැවැත්ම" පිළිබඳ දාර්ශනික මනෝවිද්‍යාත්මක විමසුමක්

( කොළඹ රත්නපුර සහ මහනුවර දිස්ත්‍රික්කයන්හි ක්ෂෙත්‍ර පර්යේෂණයක් ඇසුරෙනි).

ඈත දාර්ශනික යුගයේ සිට මෑත දාර්ශනික අවධිය දක්වාම විවිධ දාර්ශනික සම්ප්‍රදායන් තුළ සදාචාර දර්ශනය යටතේ පවුල හා විවාහය සම්බන්ධ බොහෝ සංකල්ප අන්තර්ගත වී තිබේ. සමාජයේ ජීවත්වන පුද්ගලයන්ට යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය මාර්ගය විවිධ දාර්ශනිකයන් පෙන්වා දී තිබේ. එමෙන්ම පවුලේ ගැටලු ඇතිවන්නේ ඇයි සහ එම ගැටලු නිරාකරණය කරගන්නේ කෙසේද යන්න පිළිබඳ ව ද දාර්ශනිකයන්ගේ අවධානය යොමු වී තිබේ.

"පවුලේ යහපැවැත්ම" පිළිබඳ දාර්ශනික මනෝවිද්‍යාත්මක විමසුමක් නැමැති පර්යේෂණය සිදු කිරීමට අරමුණු කරන ලද්දේද පැරණි දාර්ශනික මත වත්මන් සමාජයට අදාළ කරගත හැකි ආකාරයන් මොනවාදැයි ඉස්මතු කර එමගින් යහපත් පවුල් පරිසයක් බිහි කරමින් පුද්ගල ජීවිතයේ සංවර්ධනයට එය ඉවහල් වන ආකාරය පෙන්වා දීම ය.

මෙම පර්යේෂණය සිදු කිරීමේදී මූලාශ්‍රය අධ්‍යයනය මගින් තොරතුරු ලබා ගැනීමට පමණක් සීමා නොවී ක්ෂේත්‍ර පරීක්ෂණයකට යොමු වූයේ වර්තමාන තත්ත්වය අවබෝධ කරගෙන එමගින් ඇතිවන ගැටලු නිරාකරණය කිරීමට යම් මඟ පෙන්වීමක් කිරීම උදෙසා ය.

මෙහිදී පරිච්ඡේද කිහිපයක් ඔස්සේ කරුණු ඉදිරිපත් කර තිබේ.

පළමු පරිච්ඡේදයෙන් අදාල පර්යේෂණ මාතෘකාව සහ එම පර්යේෂණය සිදුකරන ආකාරය හැඳින්වීම කරන ලදි. එහිදී පර්යේෂණයේ අරමුණ පර්යේෂණ ක්‍රමවේදය, නියැදිය තෝරාගත් ආකාරය, මූලාශ්‍රය පරිශීලනය කරන ලද ආකාරය සහ පර්යේෂණයේදී භාවිතා කරන ලද විධි ක්‍රමයන් මෙන් ම පර්යේෂණයේදී මතු වූ සීමා මොනවාද යන්න පිළිබඳවත් කරුණු ඉදිරිපත් කරන ලදි.

දෙවන පරිච්ඡේදය මගින් පවුල් ඒකකය හා විවාහ ඒකකය පිළිබඳ එහි ඓතිහාසික වර්ධනය පිළිබඳවත් විවිධ දෘෂ්ටිකෝණ ඔස්සේ කරුණු ඉදිරිපත් කරන ලදි.

තුන්වන පරිච්ඡේදය මගින් පවුල් ඒකකය සහ විවාහ ඒකකය පිළිබඳව දාර්ශනික හා මනෝවිද්‍යාත්මක ආකල්ප මොනවාද යන්න පැහැදිලි කරණ ලදි. විශේෂයෙන් බටහිර දර්ශනයේ ග්‍රීක යුගයේ විසූ සොක්‍රටීස්, ප්ලේටෝ හා ඇරිස්ටෝටල් යන දාර්ශනිකයන්ගේ අදහස් මෙන්ම නූතන යුගයේ හියුම් කාන්ට් වැනි අයගේ අදහස්ද සාංදෘෂ්ටිකවාදී දාර්ශනිකයන්ගේ ජීවිත දර්ශනය පිළිබඳ ව ද තොරතුරු ඉදිරිපත් කර තිබේ.

සිව්වන පරිච්ඡේදය මගින් විවාහය හා පවුල් ඒකකය පිළිබඳ ආගමික මතවාද ඉදිරිපත් කරන ලදිග විවිධ ආගම්වලින් කරනු ලබන්නේ මිනිසා සදාචාර ජීවිතයකට යොමු කිරීම ය. බෞද්ධ හින්දු, කතෝලික හා ඉස්ලාම් ආගම්වලට අනුව පවුල හා විවාහය පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට මෙහිදී කටයුතු කරන ලදි.

පස්වන පරිච්ඡේදය මගින් යහපැවැත්ම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර තිබේ. යහපැවැත්ම වර්තමනායේ මනෝවිද්‍යා ක්ෂේත්‍රයේ බහුල ව සාකච්ඡාවට ලක්කරන අංශයකි. ඒ පිළිබඳ විවිධ දාර්ශනික මතවාද ඉදිරිපත් කිරීම සහ පවුලේ යහපැවැත්ම බිඳී යාමට බලපාන හේතු මොනවාද යන්න දක්වීම මෙහිදී සිදුකර තිබේ.

හයවන පරිච්ඡේදය මගින් ක්ෂෙත්‍ර අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම සිදුකර තිබේ. එහිදී ගැමි හා නාගරික ජීවන රටාවේ යහපැවැත්ම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් සිදුකර තිබේ. ගැමි ජීවන රටාව හා සසදන විට නගරයේ පවුල්වල යහපැවැත්ම බොහෝ සෙයින් අඩුවී ඇති ආකාරයත් නියැදි සමීක්ෂණයේ ප්‍රතිඵලවලින් ද දැකගත හැකිවී තිබේ. අවසානයට නිබන්ධයේ සමාලෝචනය ඉදිරිපත් කර තිබේ. එහිදී පර්යේෂණයේ ප්‍රතිඵල හා පවුල් ජීවිතයේ ගැටලු ඇතිවී ඇති ආකාරයත් ඒවා නිරාකාරණය කර ගැනීම තුළින් යහපත් පවුල් පරිසරයක් නිර්මාණය කරගත හැකි ආකාරයත් සංක්ෂිප්ත ව දක්වා තිබේ.